බලංගොඩ අධ්‍යාපන කලාපය

නර්තනය - 7 ශ්‍රේණිය

II වාරය

**නිපුණතා මට්ටම 6.4 :- විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව අගයමු**

**ක්‍රියාකාරකම :- රාමසාන් උත්සවය**








රාමසාන් උත්සවය

රාමසාන් උත්සවය අරාබිය, මැලේසියාව, ඉන්දුනීසියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව ආදි රටවල වෙසෙන ඉස්ලාම් බැතිමතුන්ගේ උත්සවයකි. මුස්ලිම් ආගමික නීතිය අනුව සෑම ඉස්ලාම් භක්තිකයකු විසින් ම අනිවාර්යයෙන් ම රැකිය යුතු නෝම්බි ඇල්ලීම හෙවත් උපවාස ශීලය මාසයක් පුරා ආරක්ෂා කර අවසන් කරන දිනය රාමසාන් උත්සව දිනය යනුවෙන් හැඳින්වේ. මෙම උපවාස ශීලය ආරම්භ වීමට හේතු වී ඇත්තේ ඉස්ලාම් ආගමිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය වන 'අල් කුර් ආනය'' ලොව පහළ වූ කාලය සිහිපත් කිරීමේ අභිප්‍රායය යි. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව සෑම ඉස්ලාම් භක්තිකයකු විසින් ම අනිවාර්යයේ ම කළ යුතු මෙකී උපවාසය සඳහා අවු. 07ට අඩු වයස්වල දරුවන්ට, ශරීර ශක්තියෙන් දුර්වල රෝගීන්ට හා වයස්ගත වූවන්ට අවසර නොලැබේ.

උදෑසන හිරු උදාවත් සමඟ ප්‍රථම යාඥාවෙන් ආරම්භ කරන උපවාසය හිරු බැස ගිය පසු නිමා කොට ආහාර පිළියෙළ කරගෙන දවසේ එක ම ආහාර වේල අනුභව කිරීම මොවුන්ගේ සිරිතකි. උපවාස කාලය ආගමික කටයුතු සඳහා වෙන් වූ කාලයක් බැවින් මේ මාසයේ දී ඉතා ම භක්තියෙන් හා කැපවීමෙන් ආගමික කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට ඉස්ලාම් භක්තිකයෝ යොමු වෙති.

අල්ලාහ් දෙවියන්ගේ ආශීර්වාදය මත මේ කාලයේ දුප්පත් පොහොසත් භේදයකින් තොර ව තමන් පිළියෙළ කර ගන්නා ආහාර, ධන ධාන්‍ය වස්තු ඇඳුම් පැළඳුම්, බෙදා හදා ගැනීමෙන් බොරු කීම, මත්පැන් පානය කිරීම වැනි දුශ්චරිතවලින් මිදීමෙන් උපවාස ශීලය රැකීම මෙහි සුවිශේෂ ලක්ෂණයකි. එමෙන් ම මානසික සංවර බව, කායික සංවර බව ද ඇති කොට ගෙන යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා වසරකට වරක් යොමු වන මේ උපවාස කාලය (නෝම්බි ඇල්ලීම) ජුනි මාසයේ පෝ දින සඳ බැලීමෙන් පසු ව යළි ජූලි මාසයේ පෝ දින සඳ බැලීමෙන් අවසන් වේ.

නෝම්බි අවසන් වූ පසු සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර මෙන් නෑදෑ හිතවතුන්ගේ නිවෙස්වලට යාම ද සිදු කරනු ලැබේ. මේ අනුව ඉස්ලාම් බැතිමතුන්ගේ සමගිය වර්ධනය වීමත්, ආගමික වශයෙන්, ජාතික වශයෙන් එක් වී දියුණුව සඳහාත් ''රාමසාන් උත්සවය'' දෙවියන් වහන්සේගෙන් ඔවුනට ලැබුණ සැබෑ ආදර්ශයක් ලෙස සලකති.

පසු වැඩඃ- රාසමාන් උත්සවය පැවැත්වීමේ වටිනාකම් දෙකක් විස්තර කරන්න

සැකසුමඃ- බී.එස් වීරසිංහ

ර/ උඩගම මහා විද්‍යාලය